




සිසිර දිසානායක

# අවුරුද්දට අලුත් සින්දු

"කිරි ඉතිරේවා " නව වසරේ........!"
පැන්සල නාන කාමරේ ඇතුලේ නාන ගමන් ජෝතිපාල මහත්තයා ගායනා කරපු සින්දුවකට මුල පිරුවා.

"ටොයිලට් එෆ්. එම් අදත් පාන්දරම විකාශය පටන් අරගෙන වගේ .........." පන්හිඳ එහෙම කිව්වට දැන් උදේ නවය විතර වෙලා.

"ජනප්‍රිය ගී කවි කර දෙනු ලැබේ........" පින්සල තවම ඇඳේ.

"සිංහල අවුරුදුත් ළඟයි නේද? ඇත්තටම ලංකාවේදි නම් අවුරුදු ලබනවා කියලා දැනෙන්නෙ කොහා හන්ද. ඒකටම හරියන්න රේඩියෝවල ටී.වී. වල ප්‍රචාරය කරන සින්දු හන්ද......." පින්සලට ගම රට මතක් වෙලා.

"කොහාගේ ගායනාව වගේම අවුරුද්දට අපේ කවි සින්දුත් සම්බන්ධයි. අවුරුද්ද කියන්නේ ගොවිතැන් කරන අය අස්වනු ගෙට අරගෙන සතුටින් ඉන්න කාලයේ පවත්වන උත්සවයක්-න්. කෙළි දලෙන්, සෙල්ලමෙන් ගත කරන කාලයක් මේක. මල් පළතුරු ගස්වල බර වෙලා තියෙන ලස්සන කාලයක්. ඉතින් පරිසරයට, ගොවිතැනට, අපේ සිංහල ක්‍රීඩාවලට කවිය, සින්දුව කොහොමත් බැඳිලමයි තියෙන්නේ. විශේෂයෙන් ම ජන කවි, ජන ගී වගේ අපේ දේ...."

"ඒක ඇත්ත ගොවිතැනේ දී පැල් කවි, නෙලුම් ගී වගේ දේවල් මොන තරම් තියෙනවද? ඔන්චිල්ලා පදිනකොට රබන් ගහනකොට, ගුඩු පනිනකොට, අං අදිනකොට වාරම්, පද, කෙළි ගී නැත්තම් ලොකු අඩුවක්නේ. " පින්සලත් කතාවට එකතු වුණා. නිවාඩු දවසක් වුණ හන්ද හොඳයි ඉතින්.

"ඇත්තටම අපිට මග ඇරිලා යන්නේ ඔය වගේ දේවල්. ඔන්චිල්ලා ගැන කියනකොට මතක් වෙන්නෙ මාව ඔන්චිල්ලාවෙන් වැටුණ දවස."

"හරමානිස් මාමගේ ඔන්චිල්ලාවෙන් ද?" පැන්සල නාන කාමරේ කටයුතු ඉවර කරලා වගෙයි. හනිකට ඇඳෙන් පැනගත්ත පින්සල නාන කාමරේට රිංග ගත්තා.

හරමානිස් මාමා වැඩ කළේ කොළඹ වරායේ. ඒ හන්ද ද මන්දා ඒ ගෙදර හොඳ තංගුස් කඹ තිබුණා. අවුරුදු කාලෙට හරමානිස් මාමා ඒක ළඟ තියෙන උස ගස් දෙකක් හරහට ලොකු කඹයක් බැඳලා, ඒ කඹේට තවත් කඹ දෙකක් පහතට වැටෙන්න බැඳලා ඔන්චිල්ලාවක් බඳිනවා. අර ගස් දෙක තියෙන්නේ පොඩි පල්ලමක ඉහළ කොටසේ. ඉතින් අර උස ඔන්චිල්ලාව පදින්න ළමයි එකතු වෙන්නේ ඉහළට. ඔන්චිල්ලාව පල්ලමටයි පදින්නේ. පල්ලමේ උස පොල් ගහක් තියෙනවා. කොල්ලො ඉතින් දඟලන්නෙ හොඳට වාරුව අරන් ගිහින් අර පොල් ගහේ කරටිය මට්ටමට යන්න. විසේ තියෙන කොල්ලො විතරක් නෙවි; කෙල්ලොත් ඔන්චිල්ලාව පදින්නෙ හිටගෙන. ඇයි හොඳට වාරුව ගන්න පුළුවන්නේ.

"මාත් ඉතින් එදා පාර පොල් කරටිය අල්ලන්න හිතාන හිටගෙන වාරු ගත්තා. පොල් කරටිය ගාවට ගිය සන්තෝසෙට පොල් අත්තට පයින් අනින්න ගිහින් ලිස්සලා ගියේ නැද්ද හරස් පොල්ලෙන් කකුල් දෙකම." පන්හිඳ කතාවට මුල පිරුවා.

"ඉතින් ?" පැන්සලත් උනන්දුයි කතාවට.
"හොඳ වෙලාවට කඹ පටවල් දෙක හොඳට අල්ලාගෙන උන්න හන්ද බිමට වැටුණෙ නෑ. ඒත් උඩ ඉඳන් කඹේ එල්ලිලා කණ්ඩිය ගාවට ආව වේගෙට කකුල් දෙකම කණ්ඩියේ වැදිලා විළුඹවල් දෙකම කොර වුණා."
"ඉතිං?"

"වෙද ගුරුන්නාන්සේගේ තෙල් පත්තුවලට පින් සිද්ධ වෙන්න දැන් නම් ආබාධයක් නෑ. ඒත් ඉතින් ඒ අවුරුදු කාලෙම ගෙවුණ කකුල් දෙක කරේ තියාගෙන එක තැන් වෙලා. ඊටත් වැඩිය දඬුවමක් කොයින්ද?"

"අනේ ඉතින් ඔය හරමානිස් මාමා නැතිවුණාට පස්සේ ඔන්චිල්ලාව බඳින්න ගස් යවන්න කෙනෙක් නෑ. පළාතෙම ගියත් ඒ වගේ හොඳට ගැට දන්න අයත් නෑ. හිටියත් විස්වාසෙකුත් නෑ."

"ඔව් ඉතින් ජේම්ස් ලා රෑට රෑට හොර පොල් කඩන්න ගස් නැංගට දවාලකට ඇහුවොත් කියන්නේ ගස් නගින්න දන්නෙ නෑ කියලනෙ. ඉතින් කොහොමද ඔය මිනිස-"සු විස්වාස කරන්නෙ? "



"හැබැයි ඉතින් ඔය වාගේ හැකියාවල් තියෙන අය සමාජෙට අරගෙන ඒ හැකියාවල් හොඳ දේකට යොදගන්න පුළුවන්නම් ඒකයි වටින්නේ. මේ අවුරුදු කාලෙ හිතට ගන්න ඕන දෙයක් ඒක."

මේ පාර අවුරුදු කාලෙට කරන්න සින්දුවක් ලියලා එවන්න කියලා සහන් රන්වල මහත්තයා එවලා තිබුණ තාලය ගැන පන්හිඳට සිහියට ආවා. සින්දුවට හොඳ නිමිත්තක් නේද මේ? එවලා තිබුණ සංගත තැටිය වාදන යන්තරේට දලා පන් ලියන මේසෙ වාඩි වුණා. වැද්දන් කැඳවීමේ කංකාරිය, තුන් සරණේ කවි, ජන ගී නාද මාලා මූලික කරගෙන තනුව හදලා තිබුණේ රන්වල ජන ගී කණ්ඩායමේ ජනක හේමන්ත හෙට්ටිආරච්චි තරුණයා. වේදිකාවෙ රඟපාන්න හොඳ ජවනිකා මැවෙන පද ටිකකුයි ඒ අයට ඕන කරලා තිබුණෙ, ඒ වගේම බොහොම සරළ විදියේ වචන තමයි ගැලපෙනවා කියලා හිතුවෙ:

කාන්තාව:
කවුද අනේ ආත - බූත කඩාන මේ දුවන්නේ ?
මොකද අනේ හැංගෙන්න ද අටුව උඩට නගින්නේ
කොහෙද අනේ හැංගි හොරුන් හංගන තැන් තියෙන්නේ ?
දන්නව නේ අටුව පුරා වී පිරිලා බොලන්නේ ?

පිරිමි :
රෑට රෑට හැංගි - හැංගි ගෙඩි කැඩුවත් හො-රෙන්නේ
දවල්ට ගස් නගින කෙනෙක් නැතිවයි මේ හොයන්නේ
ඔන්චිල්ලාවක් බඳින්න කවුරුද ගස් යවන්නේ ?

ගෑනු:
කොයි කාට කාටත් කායෙ කායෙත්
වටිනාකම් තේරෙයිනම්
කොයි කවුරු කවුරුත් කාට කාටත්
උදව් පදව් වේවි ඉතින්

පිරිමි:
රෑට රෑට හැංගි - හැංගි ගෙඩි කැඩුවත් හො-රෙන්නේ
දවල්ට ගස් නගින කෙනෙක් නැතිවයි මේ හොයන්නේ
ඔන්චිල්ලාවක් බඳින්න කවුරුද ගස් යවන්නේ ?

කාන්තාව:
අවුරුද්දේ සතුටු වෙන්න
මේ හැමෝම එකතු වෙන්න
හැංගි හොරෝ බිමට එන්න
මුන්දලාට උදව් දෙන්න

පිරිමි හා ගැහැණු:
අඟ - හිඟ කම්, නැති - බැරි කම් අපි කාටත් තියෙන්නේ
අවුරුද්දේ නරක පුරුදු අත හැරියොත් හොඳයිනේ

නාන කාමරේ මධ්‍යාහේන විකාශයත් පින්සල පටන් අරන් වගේ.
"බැද්ද පුරා සුදු රෙද්ද වගෙයි අද......." පියසිරි විජේරත්න මහත්තයාගේ අවුරුදු සින්දුව පින් කවි කරන්න පටන් අරන්. පින් දන්නෙ සින්දු ගායනා කරන්න නෙවි; කියන්න විතරයි. ඒත් ඒ සද්දෙට පන්ට පරණ අවුරුදු සින්දු ගණනාවක්ම මතකයට ආවා.
"පෑන්ට මතක ද සනත් නන්දසිරි මහත්තයයි, සුජාතා අත්තනායක මහත්මියයි ගායනා කරපු " කොහෝ " කොහෝ " සින්දුව? පන් පෑන්ගෙන් ඇහුවා.
"ඒක ඉතින් නිල අවුරුදු සින්දුව වගේනේ සමහර මාධ්‍යවලට."

"බක් මහ දීගෙ චිත්‍රපටයට වික්ටර් රත්නායක මහත්තයා ගායනා කරපු "බක්මහටයි අවුරුදු ලබන්නේ" ඒ මහත්තයා මාලනී බුලත්සිංහල මහත්මිය එක්ක ගායනා කරපු "සිංහල අවුරුදු ළඟයි නගේ" වාගෙ සින්දු වැඩිය ප්‍රචාරය වුණේ නෑ මගේ මතකයේ හැටියට. ඒත් අමරදේව මහත්තයා ගායනා කරපු "මල් ගොමු ගුමු", " දෙඩම් කපාලා" වාගෙ සින්දු නම් ප්‍රචලිත වුණා. රෝහණ බැද්දගේ මහත්තයත් අවුරුදු සින්දු කරලා තියෙනවා."

"සිංහල අවුරුදු සින්දු අතරින් ලයනල් රන්වල මහත්තයා ගායනා කරපු "මේ අවුරුදු කාලේ" සින්දුවත් අපේ අය අතරට ගියා හොඳට. "කජු වාරේ", "පාන් කිරිත්ති", "වන්නම් සව්දම්", වගේ සින්දුත් අවුරුද්දට ප්‍රචාරය වෙන සින්දු. සහන් රන්වල මහත්තයා ගායනා කරපු " කිරි වදිනා" සින්දුව, ඒ කණ්ඩායමේ ළමයින් ගායනා කරපු " කුන්ද හට්ටි" වාගෙ සින්දුත් අවුරුදු පසුබිමෙන් ලියවුණ සින්දු. ඉතින් ඔය අහලා පුරුදු සින්දු ගැන මතක් කරගෙන තවත් අලුත් සින්දුවකින් මේ කතාව ඉවර කළොත් හොඳය කියලා හිතනවා. කාලයකට උඩ දී රන්වල ජන ගී කණ්ඩායමේ ම උන්නු වසන්තා මධුරාංගනී මහත්මියගේ තනුවකට ලියවුණ අවුරුදු සින්දුවක් මේ"

පංච පෙත්තේ - කවඩි හිනැහෙන්නා
මල් හිනා අරගෙන
අළුත් අවුරුදු නැකතින් ගෙට එන්නා !

සාර අස්වනු ආවම බිස්සට
කාට කාටත් සාරයි අතමිට
නෑයො - යාළුවො ඇවිත් ගම රට
කායෙ කායෙත් අවුරුදු සරුයි මෙද.......

කොවුලන්නේ නාදේ මවනා සව්දම්
ඔන්චිල්ලේ වාරුව කවනා වාරම්
අත ලෙලෙනා ගිගිරින් හඬනා
රබන් පදේ තාලෙ අරන්
සිංහලය ම එක් වී ගයනා
ජන ගීයට තාලෙ පුරන් !

වෙල්දෙණියේ පිම්මේ නටනා සෙල්ලම්
වැව් පිටියේ කෙළි ගී මැද්දෙ සරදම්
ඉපනැල්ලෙන් අහසට නැගෙනා
ඔල්වරසන් රාවෙ අරන්
තුන් හෙළයම එක් වී ගයනා
ජය ගීයට නාදෙ පුරන් !






BMJ TOURS

- Snow Trips
- Airport Transfers (Pick up and drop off)
- Interstate Tours
- Local Tours
- 24 hours 7 days a week
- 24, 12, 8 Seated Vehicles

Air Conditioned, Safety Seatbelts

Sorrento Ferry
Ballarat
Sovereign Hill

Snow Areas
Mt Hotham, Mt Buffalo, Mt Buller, Mt Baw Baw

Great Ocean Road
Sorrento Ferry
The 12 Apostles

Lake Entrance
Buchan Caves

Philip Island
Penguin Parade, The Nobbies, Wildlife Park

Cooray
Tel- 85028580
Mob- 0421741244
- 0401369218

Accreditation (S001929) Department of Infrastructure Hazardous Area Authority (Alpine)